**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**
**ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු කඩ කුලී තැන්පතු ශේෂය රු.2,364,450 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 අවසන් ගිණුම් මඟින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී බිල් කිරීම් වටිනාකම රු.803,948 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ආරම්භක හිඟ කඩ කුලී ශේෂය සත්‍ය හිඟ කඩ කුලී ශේෂය සමඟ තිබූ වෙනස ඉවත්කර සත්‍ය අවසාන කඩ කුලී ශේෂය ගැලපීම් කිරීම මඟින් වර්ෂයට අදාළ කඩ කුලී ශේෂය ගිණුම්ගත කිරීම සිදු කළ බව. | වර්ෂයට අදාළ බිල් කිරීම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති 04ක එකතු වටිනාකම රු.20,941,054 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මෙම දෝෂය 2023 අවසන් ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,903,119 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,918,824 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 1,649,311 | 1,483,222 | 1,555,086 | 2,151,246 | 1,539,312 | 1,482,785 | 1,355,649 | 2,223,110 |
| ii. | කුලී | 16,341,697 | 10,844,798 | 19,072,517 | 1,893,475 | 15,028,444 | 14,841,767 | 6,390,997 | 10,121,194 |
| iii. | බලපත්‍ර ගාස්තු | 2,102,500 | 2,331,712 | 2,167,062 | 526,300 | 2,102,500 | 1,956,962 | 1,822,912 | 361,650 |
| iv. | වෙනත් ආදායම් | 4,387,860 | 5,198,578 | 5,398,102 | 269,689 | 3,298,420 | 3,669,780 | 3,654,808 | 469,213 |
| | එකතුව | 24,481,368 | 19,858,310 | 28,192,764 | 4,840,710 | 21,968,675 | 21,951,294 | 13,224,366 | 13,175,167 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.2,151,246 ක් විය. | නීතිමය කටයුතු පසුගිය වසර ගණනාවක් තුළ ආර්ථික හා සෞඛ්‍ය අර්බුදයන් හේතුවෙන් සිදුකිරීමට නොහැකි වූ බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.1,643,999 ක් විය. | හිඟ මුදල් මේ වන විට අයකර ගැනීමට මෙන්ම අදාළ කඩ ගිවිසුම් අවලංගු කර කඩ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට හා නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාව සතු රු.34,910,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 06 ක් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ලේඛනයක් ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කර නොතිබුණු අතර ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ලේඛනයක් නඩත්තු කළ යුතු අතර ලැබිය යුතු පොලී ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.250,391,167 ක් වටිනා ගිණුම් ශේෂ 08 ක් සඳහා ලෙජර් ගිණුම් සකස් කර නොතිබුණි. | ඉදිරියේ දී සියලු ශේෂයන් ලෙජර් ගිණුම් මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | එක් එක් ශේෂ සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වා ගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පල භූමියෙහි කඩ කාමර 49 කින් කඩ කාමර 20 ක් කඩ හිමියන් විසින් අතුරු බදු දී ඇති බව නිරීක්ෂණය වූ අතර සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කඩ කාමර හිමියන් මේ වන විට අසාදු ලේඛනගත කර ඇති අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත යොමුකර ඇති බව. | අතුරු බදු දීම් වළක්වාලීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දේපල මත 2011 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අයකරනු ලබන අතර කාලීනව එම දේපල තක්සේරු කර ඒ මත වරිපනම් බදු අය කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ සඳහා ඉල්ලීම් රාශියක් වාර්ෂිකව මධ්‍යකලාපුව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදුකළ ද ඔවුන්ගේ ප්‍රමාදයන් හේතුවෙන් නව තක්සේරුවක් සිදුකිරීමට නොහැකි වී ඇති බව. | කාලීනව තක්සේරු කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.311,267,148 ක් වූ ස්ථාවර වත්කම් වර්ගීකරණයන්ට අදාළ උපලේඛනවල සටහන් වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛන වටිනාකම් ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 44 ක හා ක්‍රීඩා පිටි 38 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම දේපල විධිමත් මැනුම් කිරීමට කටයුතු සිදුකරමින් පවතින අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විධිමත් පවරා දීමක් සිදුකළ පසු තක්සේරු කිරීම් සිදුකිරීමට හැකි බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතු වාහන 03 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වසරේදී එම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබූ භාණ්ඩ අයිතම 27 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | -එම- |
| (ඉ) | සභාව සතුව පවතින භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 05 ක් වසර 09 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | අක්‍රීය වාහන මේ වන විට නැගෙනහිර පළාත් සභාව විසින් වෙන්දේසි කිරීම් සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අක්‍රීය තත්ත්වයේ පවතින වාහන රථ වාහන වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභාව සතු අලුත්වැඩියා කර භාවිතා කළ හැකි බැකෝ ලෝඩර් යන්ත්‍රය 2021 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට රු.ලක්ෂ 35 ක් පමණ වැය වන බව ඇස්තමේන්තුකර ඇති බැවින් එම මුදල් ප්‍රතිපාදන සභාවට දැරීමට නොහැකි නිසා අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින බව. | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ දී මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දී අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සභාව භාරයේ පවතින වාහන 08 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | UNEP ආයතනය විසින් සභාවට පරිත්‍යාග කළ වාහන සඳහා මේ වන විට පැවරුම් සභාවට සිදු කිරීමට නොහැකි වී ඇති අතර අනෙකුත් ආයතන මඟින් ලබා දී ඇති හා පරිත්‍යාග කර ඇති වාහන | වාහනවල අයිතිය සභාවේ නමට පවරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වල විධිමත් පැවරුම් අප ආයතනය සතුව නොමැති බැවින් පැවරුම් සිදු කිරීමට නොහැකි වී ඇති බව. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 13 ක් පුරප්පාඩුව පවතින අතර ඊට ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් ද ඇතුළත් විය. | නැගෙනහිර පළාත් සභාව විසින් මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම මත මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට නොහැකි වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සේවක ණය ලේඛනය අනුව රු.123,060 ක් වටිනා ණය ශේෂ 02 ක් අය නොවී පවතින බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අයකිරීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |